**ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව**

---------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

------------------

**1.1 මතය**

------

ශීර්ෂය 243 - සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 10 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

--------------------------------------------------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය සෘණ රු.18,646,267,760 ක් වී තිබුණි. සංශෝධිත ACA – 7 ආකෘතියේ සඳහන් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව 2021 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගැලපුම් ශේෂය සෘණ රු.18,646,267,760 ක් වී ඇත. එම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අග්‍රිම ශේෂය සමඟ ගැලැපූ විට එය සෘණ රු.37,292,535,520 ක් වේ. නමුත් අග්‍රිම ගැලපුම් ශේෂය ධන රු. 18,646,267,760 ක් විය යුතුව තිබුණත් එය සංශෝධිත ACA 7 ආකෘතිය නිවැරදි ලෙස ඉදිරිපත් නොකර තිබීම නිසා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දක්වා ඇති සටහන් අනුව අග්‍රිම ගිණුමේ ශේෂය ශුන්‍ය අගයක් ලෙස තාර්කික ලෙස ඉදිරිපත් වී නොතිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම්වලින් මුළු වියදම අඩු කළ විට 2021.12.31 දිනට දෙපාර්තමේන්තුවේ අග්‍රිම ශේෂය සෘණ රු.18,646,267,760 ක් වේ. ACA 7 ආකෘතියේ අගය ද සෘණ රු.18,646,267,760 වේ. | 2021 නොවැම්බර් 26 දිනැති අංක. 2021/03 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන තාර්කිකව පිළියෙල කළ යුතු වීම |
| (ආ) | පුනරාවර්තන වැය විෂයන් 08 ක් හා මූලධන වැය විෂයන් 07 ක් සඳහා එකතුව රු.648,652,500 ක අධි ප්‍රතිපාදන සැලසීම නිසා එම ප්‍රතිපාදනයෙන් එකතුව රු.307,337,639 ක් පමණක් උපයෝජනය කිරීම නිසා එකතුව රු.341,314,861 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. ඒ අනුව එක් එක් වැය විෂය සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | 2021 වර්ෂයේ මුළු රටටම එක සේ බලපෑ COVID 19 වසංගතය හේතුවෙන් සැලසුම් කළ කාර්යයන් සිදු නොවීම. | මු. රෙ. 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු නිවැරදිව හා තාර්කිකව පිළියෙල කළ යුතු වීම. |
| (ඇ) | මුදල් පොත පවත්වා ගෙන යාම, චෙක්පත් ලිවීම, ගෙවීම් කිරීම හා මුදල් බැංකුවේ තැන්පත් කිරීම යන සියළුම කාර්යයන් එකම නිලධාරියෙකු විසින් ඉටු කිරීම නිසා එහි අභ්‍යන්තර පරීක්ෂාව දුර්වල වී තිබුණි. | එකඟ වේ. | අභ්‍යන්තර පරීක්ෂාව සිදුවන පරිදි කටයුතු කළ යුතු වීම. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**කාර්යසාධනය**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ''සිගිති'' පාසල ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 62 දෙනෙකු වෙත රු.මිලියන 63 ක් ලබා දී තිබුණි. ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය සඳහා වන පොළියෙන් සියයට 50 ක් දෙපාර්තමේන්තුව විසින් අදාළ බැංකු වෙත ගෙවිය යුතුව තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු වෙත එකතුව රු.1,175,779 ක පොළියක් ගෙවිය යුතුව තිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. | ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ආ) | ''රැකවරණ'' ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් නව දෙනෙකු වෙත රු.මිලියන 44.4 ක් ලබා දී තිබුණි. එම ණය යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා වන පොළියෙන් සියයට 75 ක් දෙපාර්තමේන්තුව විසින් අදාළ බැංකු වෙත ගෙවිය යුතුව තිබුණි. දෙපාර්තමේන්තුව විසින් 2021 දෙසැම්බර් 31 දිනට වාණිජ බැංකු වෙත එකතුව රු.2,290,831 ක පොළියක් ගෙවිය යුතුව තිබුණි. | පොළී සහනාධාර ඉල්ලීම් ප්‍රමාද වී දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වීම. | අදාළ පොළී සහනාධාර සඳහා වන ඉල්ලීම් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) | ''මගේ අනාගතය'' ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 729 දෙනෙකු වෙත රු.මිලියන 650.50 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය සඳහා පොළිය සියයට සියයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය රු.7,627,617 ක් ගෙවිය යුතුව තිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. | ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඈ) | ''ඇරඹුම'' ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 175 දෙනෙකු වෙත රු.මිලියන 230.99 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් පොළිය සියයට සියයක්ම දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.4,763,064 ක් ගෙවිය යුතුව තිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. | - එම - |

| | | | |
|---|---|---|---|
| (ඉ) | “රිවි බල සවිය” ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 453 දෙනෙකු වෙත රු.මිලියන 157.6 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 75 ක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.1,452,873 ක් ගෙවිය යුතුව තිබුණි. | පොළී සහනාධාර ඉල්ලීම් දෙසැම්බර් දෙවන සතිය වන විට අදාළ බැංකු විසින් ඉදිරිපත් නොකිරීම නිසා ඉතිරි ප්‍රතිපාදන වෙනත් වැය විෂයකට මාරු කරන ලදි. | අදාළ පොළී සහනාධාර සඳහා වන ඉල්ලීම් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඊ) | “ජය ඉසුර” ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 1,000 දෙනෙකුට රු.මිලියන 21,357.4 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 50 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.934,728,127 ක් ගෙවිය යුතුව තිබුණි. | - එම - | - එම - |
| (උ) | “හරිත ණය” යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 242 දෙනෙකු වෙත රු.මිලියන 791.5ක් ලබාදී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 50 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.28,165,682 ක් ගෙවිය යුතුව තිබුණි. | පොළී සහනාධාර ඉල්ලීම් ප්‍රමාද වී දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වීම. | අදාළ පොළී සහනාධාර සඳහා වන ඉල්ලීම් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඌ) | “දිරි සවිය” ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 572 දෙනෙකු වෙත රු.මිලියන 413.3 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් පොළිය සියයට සියයක්ම දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.12,848,075 ක් ගෙවිය යුතුව තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (එ) | ''රිය ශක්ති'' ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 178 දෙනෙකු වෙත රු. මිලියන 613.8 ක් ලබාදී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 75 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.25,571,440 ක් ගෙවිය යුතුව තිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම. | ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඒ) | ''මාධ්‍ය අරුණ'' ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 258 දෙනෙකු වෙත රු. මිලියන 76.9 ක් ලබාදී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් පොළිය සියයට සියයක්ම දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.1,127,807 ක් ගෙවිය යුතුව තිබුණි. | පොළී සහනාධාර ඉල්ලීම් ප්‍රමාද වී දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වීම. | අදාළ පොළී සහනාධාර සඳහා වන ඉල්ලීම් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඔ) | ''සංචාරක පොඩ්ඩෝ'' ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 1,198 දෙනෙකු වෙත රු. මිලියන 538.46 ක් ලබාදී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 50 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.16,266,641 ක් ගෙවිය යුතුව තිබුණි. | - එම - | - එම - |
| (ඕ) | ''සිටි රයිඩ්'' ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 8 දෙනෙකු වෙත රු.මිලියන 52.1 ක් ලබාදී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 75 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.426,637 ක් ගෙවිය යුතුව තිබුණි. | - එම - | - එම - |

| | | | |
|---|---|---|---|
| (ක) | "සොඳුරු පියස" ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 14,834 දෙනෙකු වෙත රු. මිලියන 2,958.3 ක් ලබාදී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 50 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.61,712,790 ක් ගෙවිය යුතුව තිබුණි. | පොළී සහනාධාර ඉල්ලීම් දෙසැම්බර් දෙවන සතිය වන විට අදාළ බැංකු විසින් ඉදිරිපත් නොකිරීම නිසා ඉතිරි ප්‍රතිපාදන වෙනත් වැය විෂයකට මාරු කරන ලදි. | අදාළ පොළී සහනාධාර සඳහා වන ඉල්ලීම් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ග) | "හෝම් ස්වීට් හෝම්" ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 1,282 දෙනෙකු වෙත රු. මිලියන 4,585.2 ක් ලබාදී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 56.7 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.99,262,678 ක් ගෙවිය යුතුව තිබුණි. | පොළී සහනාධාර ඉල්ලීම් ප්‍රමාද වී දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් වීම. | අදාළ පොළී සහනාධාර සඳහා වන ඉල්ලීම් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |
| (ඝ) | "සිහින මාලිගා" ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 247 දෙනෙකු වෙත රු.මිලියන1,332.5 ක් ලබාදී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 75 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.4,541,908 ක් ගෙවිය යුතුව තිබුණි. | - එම - | - එම - |
| (ඞ) | "රන් අස්වැන්න" ණය යෝජනා ක්‍රමය යටතේ අනුමත ණය සැපයුම්කාර ආයතන විසින් ණය ඉල්ලුම්කරුවන් 7,970 දෙනෙකු වෙත රු.මිලියන 11,469.3 ක් ලබා දී තිබුණි. මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ලබාගත් ණය වෙනුවෙන් වන පොළියෙන් සියයට 50 ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව විසින් ගෙවිය යුතුව තිබුණි. ඒ අනුව 2021 දෙසැම්බර් 31 දින වන විට වාණිජ බැංකු වෙත පොළිය ලෙස රු.157,409,834 ක් ගෙවිය යුතුව තිබුණි. | පොළී සහනාධාර ඉල්ලීම් දෙසැම්බර් දෙවන සතිය වන විට අදාළ බැංකු විසින් ඉදිරිපත් නොකිරීම නිසා ඉතිරි ප්‍රතිපාදන වෙනත් වැය විෂයකට මාරු කරන ලදි. | අදාළ පොළී සහනාධාර සඳහා වන ඉල්ලීම් අප්‍රමාදව ලබා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ම) 2015 අයවැය යෝජනාවක් අනුව 2017 වර්ෂයේ සිට බලපත්‍රලාභී වාණිජ බැංකු හා විශේෂ බලපත්‍රලාභී බැංකුවල රු. මිලියන 1.5 ක් හෝ ඊට අඩුවෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතු සඳහා සියයට 15 ක පොලී ප්‍රතිශතයක් ගෙවනු ලබයි. සාමාන්‍ය පොලී අනුපාතය හා ගෙවනු ලබන සියයට 15 ක පොලී ප්‍රතිශතය අතර වෙනසට අදාළ මුදල දෙපාර්තමේන්තුව විසින් අදාළ බැංකුවලට ප්‍රතිපූර්ණය කිරීම සිදු කරනු ලබයි. එලෙස 2021 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය කළ යුතු හිඟ පොලිය රු. 50,964,760,952 ක් වී තිබුණි. | වෙන් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ 2021 පළමු කාර්තුව දක්වා පමණක් භාණ්ඩාගාර බැඳුම්කර මගින් ගෙවීම් කිරීම. | ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කළ යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වනවිට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි. | එකඟ වේ. ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 08 න් පුරප්පාඩු 03 ක් හා ද්විතියික මට්ටමේ පුරප්පාඩුව මේ වන විට සම්පූර්ණ වී ඇත. ඉතිරි පුරප්පාඩු පිළිබඳව විද්‍යුත් මාර්ගගත ක්‍රමය මගින් කාර්තුමය වශයෙන් රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් කර ඇති අතර, අදාළ අංශ නැවත වරක් දැනුවත් කර මෙම පුරප්පාඩු හැකි විගස පුරවා ගැනීමට සටහන් කර ගනිමි. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ඉටු කිරීම සඳහා අත්‍යාවශ්‍ය කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීමටත්, අත්‍යාවශ්‍ය නොවන කාර්ය මණ්ඩලයක් පවතින විට අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කර ගැනීමටත් කටයුතු කළ යුතු වීම. |